# අපේ පවුලේ ආරක්ෂිත සටහන

( පවුල)

**ආරක්ෂිත ස්ථානය** (ආරක්ෂිත කඳවුර, ඥාති නිවසක්, මිතුරෙකුගේ නිවසක්)

**ආරක්ෂිත ස්ථානය වෙත ගමන් කරන ආකාරය**

**ආරක්ෂිත ස්ථානයට ගමන් කාලය**

විනාඩි

| සැලකිලිමත් විය යුතු කරුණු | ආරක්ෂිත ස්ථානය වෙත යාම පිළිබඳ තොරතුරු ආදිය |
|---|---|

**සුළි කුණාටුවක් ඇතිවීම**
**සුළි කුණාටුව ළඟා වීම**

කාලගුණ අනාවැකි, කාලගුණ විද්‍යා දෙපාර්තමේන්තුව විසින් ප්‍රකාශයට පත් කරන තොරතුරු සහ ගංගාවල ජල මට්ටම කෙරෙහි අවධානය යොමු කරන්න! !

[අවදානම් මට්ටම 1]
පූර්ව අනතුරු ඇඟවීමේ තොරතුරු

[අවදානම් මට්ටම 2]
තද වැසි/ ගංවතුර අනතුරු ඇඟවීම්
ගංගා: ගංවතුර අවදානම් ජල මට්ටමට ළඟා වීම
ගංවතුර අවදානම් තොරතුරු නිවේදනය

**නගර හෝ ගම් සභාව මගින් නිකුත් කරනු ලබන, ආරක්ෂිත ස්ථානයන්ට යාම පිළිබඳ තොරතුරු කෙරෙහි අවධානය යොමු කරන්න!!**

**[අවදානම් මට්ටම 3]**
**වයස්ගත පුද්ගලයන් ආදිය ආරක්ෂිත ස්ථානයට යෑම සඳහා වන නිවේදන ප්‍රකාශ කිරීම**
ගංගා: ආරක්ෂිත ස්ථානයට යාම තීරණය වන ජල මට්ටමට ළඟා වීම
ගංවතුර අවදානම් තොරතුරු නිවේදන ප්‍රකාශ කිරීම

කාලගුණ විද්‍යා දෙපාර්තමේන්තුව විසින් ප්‍රකාශයට පත් කරන තොරතුරු සහ ගංගාවල ජල මට්ටම වෙත අවධානය යොමු කරන්න!!

**[අවදානම් මට්ටම 4]**
**ආරක්ෂිත ස්ථානය වෙත යාම සඳහා උපදෙස් නිකුත් කිරීම**
ගංගා: ගංවතුර අවදානම් ජල මට්ටමට ළඟා වීම
ගංවතුර අවදානම් තොරතුරු නිවේදන ප්‍රකාශ කිරීම

[අවදානම් මට්ටම 5]
ගංගා: ගංවතුර ඇති වීම!
ගංවතුර ඇතිවීම පිළිබඳ තොරතුරු නිවේදනය කිරීම

## ප්‍රමාද නොවී ඉවත් වීමට කළ යුතු දේ

◆ රූපවාහිනියෙන් හෝ ගුවන් විදුලියෙන් සුළි කුණාටුව පිළිබඳ තොරතුරු පරීක්ෂා කිරීම
◆ ආරක්ෂිත ස්ථානය, ගමන් කරන ආකාරය, ගමන් කාලය නැවත තහවුරු කිරීම
◆ ආරක්ෂිත ස්ථානයකට යන විට රැගෙන යා යුතු දේ තහවුරු කිරීම
( ○ සලකුණ යොදන්න)
- පානීය ජලය • ආහාර • ඇඳුම් • තුවා
- ටෝච් එකක් • ජංගම ගුවන් විදුලියක් • බැටරි • ජංගම චාජරයක්
- බැංකු පොත් වැනි වටිනා දෑ • මාස්ක් • වෙට් ටිෂූ
- සාමාන්‍ය ඖෂධ • වෙනත් ( )

◆ ආරක්ෂිත ස්ථානයට යාමට පහසු ඇඳුමින් සැරසීම
*ගංගා හෝ කුඹුරු අසලට යෑමෙන් වලකිමු

◆ අපේ පවුල සඳහා වන ආරක්ෂිත ස්ථානයට යාමට නියමිත වේලාව නම්, අවදානම් මට්ටම 3 වේ
◆ වයස්ගත පුද්ගලයන් වැනි ආරක්ෂිත ස්ථානයට යාමට කාලය ගත වන පුද්ගලයින් ගමන් ආරම්භ කිරීම
- ඔබ යන ආරක්ෂිත ස්ථානය කුමක්ද යන්න පවුලේ අයට සහ නෑදෑයින්ට පැවසීම.
- (දැනුම් දිය යුතු පවුලේ සාමාජිකයින්ගේ හෝ ඥාතීන්ගේ දුරකථන අංක: ______________________________)

තිත් රේඛාව ඔස්සේ එකක් රවුම් කරන්න.

◆ අපේ පවුල සඳහා වන ආරක්ෂිත ස්ථානයට යාමට නියමිත වේලාව නම්, අවදානම් මට්ටම 4 වේ
◆ අනතුරුදායක ස්ථානවල සිට සියලු දෙනා ආරක්ෂිත ස්ථාන වෙත යාම
- ඔබේ අසල්වැසියන්ට ද කතා කර එක්ව ආරක්ෂිත ස්ථානය වෙත යාම.
- (කතා කර එකතුකර ගන්නා අය: ______________________________)

**ආරක්ෂිත ස්ථානයට ගොස් අවසන්!**

## [භාවිතා කරන ආකාරය]

- නිවසේ හොඳින් පෙනෙන ස්ථානයක මෙය අලවා තබා, ආපදාවකදී අන්තර්ගතය පරීක්ෂා කරමින් ආරක්ෂිත ස්ථානය වෙත යමු.
- අන්තර්ගත කරුණු වල යම් වෙනසක් ඇත් නම් ඒවා සමාලෝචනය කර, අපේ පවුලේ ආරක්ෂිත සටහන පරීක්ෂා කිරීම ඇතුළුව, ආරක්ෂිත ස්ථානය වෙත ගමන් ආරම්භ කිරීමට අදාළ අභ්‍යාස නිරතුරුව පවත්වමු.

# අපේ පවුලේ ආරක්ෂිත සටහන සාදමු

මෑත වසරවලදී, සුළි කුණාටු ආදිය නිසා රට පුරා වාර්තාගත අධික වර්ෂාපතනයක් නොකඩවා ලැබුණු අතර, මහා පරිමාණ ගංවතුර සහ නායයෑම් ආපදා ඇති විය. අප ප්‍රාන්තයේ ද, 2015 වසරේ සැප්තැම්බර් මාසයේ කන්තෝ/ තෝහොකු ප්‍රදේශවල අධික වර්ෂාව හේතුවෙන් පුද්ගලයින් 4,200 කට පමණ සහ 2019 වසරේ නැගෙනහිර ජපානයේ සුළි කුණාටුවෙන් පුද්ගලයින් 330 කට පමණ “නියමිත වේලාවට ආරක්ෂිත ස්ථානයන්ට යාමට නොහැකි” විය.

මෙවැනි සිදුවීම් වලක්වා ගැනීම සඳහා, සාමාන්‍ය දිනයන්වල දී, එක් එක් පවුල විසින් ආරක්ෂිත ස්ථානයකට යාම ප්‍රමාද නොවීමට කළ යුතු දේ සොයා බලා “අපේ පවුලේ ආරක්ෂිත සටහන” නිර්මාණය කරමු.

## ○ සාදන්නේ කෙසේද

① ඔබගේ නම ඇතුලත් කරන්න.

② ගංවතුරක් ඇති වූ විට ඔබ යා යුතු ආරක්ෂිත ස්ථානය සඳහන් කරන්න.
*නගර සභාවෙන් නියම කළ ආරක්ෂිත කඳවුරකට. විකල්පයක් ලෙස, අවදානම් සිතියමේ පාට කර නැති ප්‍රදේශයක සිටිනා ඥාතියෙකුගේ හෝ මිතුරෙකුගේ නිවසක් විය හැකිය.

③ ආරක්ෂිත ස්ථානය වෙත ගමන්කරන ආකාරය ලියන්න.

④ ආරක්ෂිත ස්ථානය වෙත යාමට ගතවන කාලය ලියන්න.

⑤ ආරක්ෂිත ස්ථානයට යන විට ඔබ රැගෙන යන දේ රවුම් කරන්න.


⑥ ආරක්ෂිත ස්ථානයට යා යුතු වේලාව තීරණය කර එය රවුම් කරන්න.

- [අවදානම් මට්ටම 3] වයස්ගත පුද්ගලයින් ආදිය ආරක්ෂිත ස්ථානයට යාම

ඔබ සමග ආරක්ෂිත ස්ථානයට යන පවුලේ අය අතර වයස්ගත අය ආදී එහාමෙහා යාමට කාලය ගත වන අය සිටී නම්, මෙම විකල්පය තෝරාගන්න.

- [අවදානම් මට්ටම 4] ආරක්ෂිත ස්ථානය වෙත යාම සඳහා වන උපදෙස්

ඉහත විකල්පය හැර වෙනත් අවස්ථාවල දී මෙය තෝරන්න.




## ○ අවදානම් සිතියමක් යනු කුමක්ද?

අවදානම් සිතියමක් යනු ගංවතුර හා නායයෑම් අවදානම් සහිත ප්‍රදේශ මෙන්ම ආපදා අවස්ථාවකදී ආරක්ෂිත ස්ථාන (නම් කරන ලද ආරක්ෂිත කඳවුරු ආදිය) සටහන් කළ සිතියමකි. ගංවතුර ඇතිවීමට ඉඩ ඇති ප්‍රදේශ පාට කර ඇත. ඔබේ නිවස ඇති ප්‍රදේශය ගංවතුරට ගොදුරු වීමට ඉඩ ඇත්දැයි කල්තියා සොයා බලමු.

ආපදා සිතියම සඳහා, කරුණාකර ඔබේ නගර සභාවේ වෙබ් අඩවිය පරීක්ෂා කරන්න, නැතහොත් ඔබේ නගර සභාවේ ආපදා වැළැක්වීමේ අංශය අමතන්න.



ආපදා සිතියම පහත ද්විමාන කේතයෙන් ලබා ගත හැක.